# වසර විසිපහක එකමුතුවේ ශක්තිය




උරුමයන් දරුවන් අතරට ගෙන යාමට මෙවැනි ප්‍රසංග මගින් විශාල පිටුවහලක් ලැබෙන බව කිව යුතුයි.
එමෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් නොයෙකුත් අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම වගේම පවුලේ ක්‍රියාකාරකම් සඳහා වෙනම දිනයක් වෙන් කිරීම. වැනි කටයුතු රැසක් අප විසින් කරනු ලැබ තිබෙනවා

**කාලයට ඉතා ඉහල අගයක් ඇති රටක මෙතරම් සාර්ථකව ඔබ මෙවැනි උත්සව සහ ක්‍රියාකාරකම් පවත්වන්නේ කෙසේද?**

මට දියහැකි කෙටිම පිළිතුර සාමූහිකව හා සැලසුම් සහගතව වැඩ කිරීම යනුයි. අපි අපේ සාමාජිකයන්ගේ කුසලතා ඉතා හොඳින් හඳුනාගෙන තිබෙනවා. එය වෘත්තිය හෝ සහජ කුසලතා විය හැකියි. ඕනෑම ව්‍යාපෘතියක් සැලසුම් කර සාමූහිකව කර ගෙන යාමේදී ඔබ කිවූ කාල කළමනාකරණය නිතැතින්ම සිදුවන බව මගේ හැඟීමයි. සෑම වසරකම පත්කරගන්නා නිලධාරි මණ්ඩලය සැලසුම් ක්‍රියාත්මක කළත් සියලූම සාමාජිකයන් අවශ්‍යතාව පරිදි හැකි සෑම අවස්ථාවකම එකා මෙන් ක්‍රියාකාරීව දායකත්වය ලබාදීම තුල කුමන හෝ ව්‍යාපෘතියක වුවද සාර්ථක ප්‍රතිපල නෙලා ගත හැකි බව මගේ විශ්වාසයයි.

**ඕස්ට්‍රේලියානු ජන සමාජයට ඔබගෙන් සිදුවන මෙහෙවර කුමක්ද?**

මා ඒ පැනයටත් ඉතා කෙටියෙන් පිළිතුරු ලබා දෙන්නම්. මෙල්බන් බක්මහ උළෙල සෑම වසරකම ඉතා උත්කර්ශවත් අයුරින් පවත්වා ගෙන යනවා. වෙසක් උත්සවය වෙනුවෙන් ශීල ව්‍යාපාරයක් පැවැත්වීමත් ඒ වගේම නත්තල් උත්සවය වැනි අන්‍ය ආගම් උත්සව පවත්වනු ලැබීමත්, පොදු සමාජ සුභ සාධන කටයුතු වලදී ද්‍රව්‍යමය හා සේවා අංශයෙන් කරන සේවාවන්ද සඳහන් කළ හැකිය. ඊට අමතරව රෝයල් මෙල්බර්න් ළමා රෝහල වෙනුවෙන් good friday appeal වලට ක්‍රියාකාරීව සම්බන්ධවීම, ඕස්ට්‍රේලියාව පිරිසිඳු කිරීමේ දිනයේදී අප ලබා දෙන දායකත්වය වගේම හදිසි ආපදාවන් වලදී අවශ්‍යතාව පරිදී සෑම විටම හැකි උපරිම මෙහෙවර අප සමිතිය විසින් කරනු ලබනවා.

**ලක් මව වෙනුවෙන් ඔබ කරන සේවය කුමක්ද?**

දශක තුනකට අධික කාලයක් ලක් මව පීඩා විඳි යුද්ධය පැවැති කාලයේ ශ්‍රී ලංකා යුධ හමුදා රෝහල සඳහා උපකරණ ලබා දීම එමෙන්ම සුනාමි ව්‍යසනයට ලක්මව ගොදුරුවූ අවස්ථාවේ දී ගාල්ල



කරාපිටිය රෝහලට රුපියල් ලක්ෂ 80කට වැඩි colour doppler scanner යන්ත්‍රයක් ලබා දීම, හබරාදුව මාර්ටින් වික්‍රමසිංහ පාසලට Melbourne Hall නමින් දෙමහල් ගොඩනැගිල්ලක් ලබා දීම, හබරාදුව සහ බලපිටිය රෝහල් වැඩි දියුණු කිරීම, විශේෂයෙන්ම අනුරාධපුරයේ ඉතා දුෂ්කර ගම්මානයක් වන කෑඳෑව ගම්මානය අඳුරෙන් එලියට ගෙන ඒම සඳහා ඉතා විශාල ව්‍යාතපෘති ප්රකමාණයක් අප සංගමය මගින් දියත් කරනු ලැබුවා. එම ගම් පියසේ පිහිටි ඉතා කුඩා පාසලකට සියලූම යටිතල පහසුකම් ලබාදී එය මහා විද්‍යාලයක් දක්වා දියුණු කිරීම, එම ගම්මානයට පානිය ජල යෝජනා ක්‍රමයක් සහ වගා ලිං ලබා දීම, කෑඳෑව ගම් වාසීන්ට නිවාස ව්‍යාපෘතියක් මගින් නව නිවාස ලබාදීම, එම ගම්මානයටම නව රෝහල් ගොඩනැගිල්ලක් ලබා දීම පමණක් නොව අඹගහවැව ග්‍රාමයේද විවිධ ව්‍යාපෘති මගින් නොයෙකුත් සුභසාධන කටයුතු කරගෙන යනු ලබයි. මෙම ව්‍යාපෘති සඳහා අඩුම තරමින් රුපියල් ලක්ෂ 500කට වැඩි ප්‍රමාණයක් අප සංගමය පරිත්‍යාග කර ඇත. කෙසේ වුවත් එම සුභසාධක කටයුතු මගින් අප සාමාජිකයන් ගේ සිත් සතන් තුල ඇතිවන මානසික සුවය මිල කල නොහැකි බවයි මගේ හැඟීම.

**25වන සංවත්සරය වෙනුවෙන් ඔබ සංගමය ම[illegible]න් විධිවිධාන යොදා ඇති විශේෂ ව්‍යා පෘති මොනවාද?**

ඔව්, අපේ සාමාජිකයන් බොහෝ දෙනෙකුගේ අදහස් අනුව අප ඉගෙන ගත ආයතනයට යමක් කලයුතු යයි යෝජනාවක් ගෙන එනු ලැබුවා. ඒ නිසාම ආයතනයේ විදුහල්පතිතුමාගේ ඉල්ලීම පරිදි රුපියල් ලක්ෂ 300ක වටිනාකමකින් යුත් නව hybrid තාක්ෂණාගාරයක් ලබා දීමට කටයුතු කරනු ලැබුවා.

අඹගහවැව ග්රාතමයේ පිපෙන කැකුළු නමින් පෙර පාසලක් ආරම්භ කිරීම.

විශේෂයෙන්ම මෙල්බර්න් නුවර අප සංගමය මගින් පවත්වන බක්මහ උළෙල ඉතාමත් උත්කර්ශවත් ලෙස මෙවර පැවැත්වීමට විධිවිධාන යොදා තිබෙනවා. විශේෂාංග වශයෙන් සියලූ දෙනාටම නොමිලේ සහභාගී විය හැකි carnival rides සහ ශ්‍රී ලංකාවේ ගායන ශිල්පින් සහභාගී වන සංගීත සංදර්ශනයක්ද සමග මල්වෙඩි සංදර්ශනයකුත් පැවැත්වීමට සංවිධානය කර තිබෙනවා. එපමණක් නොව බක්මහ උළෙලට සහභාගිවන වාසනාවන්තයෙක්ට අලූත්ම මෝටර් රථයක් දිනාගැනීමේ අවස්ථාව උදා කර දෙන්න ලොතරැයි දිනුම් ඇදිමකටද ඔබට සහභාගී විය හැකිය.

**අවසාන වශයෙන් අප පාඨකයන්ට ඔබට කීමට යමක් ඇතිද?**

ඔව්, අපේ ගමනට කවදත් දිරිදෙන ඔබ පුවත්පත වැනි සියලූම මාධ්‍ය ආයතන ස්තූති පූර්වකව මා සිහි කරන්න කැමතියි. ඒ වගේම මෙල්බර්න්පුර වැඩ වසන සියලූම ගරුතර ස්වාමින්වහන්සේලා ගේ අනුශාසනා අගය කොට සලකනවා. අපේ ගමනට දිරිදුන් මෙල්බර්න් ප්‍රජාව සහ ව්‍යාපාරික ආයතන කිසිදිනක අමතක කළ නොහැකිය. මෙල්බර්න්වාසි සියලූම දෙනාට මෙවර බක්මහ උළෙලට සහභාගී වන ලෙස විවෘත ආරාධනාවක් කරමින් මම නවතිනවා.





**මෙම ලිපිය අවසන් කරන්නට මත්තෙන් ඉතා වැදගත් කරුණක් සඳහන් කිරීමට කැමැත්තෙමි. "සංහිඳියාව" නම් අලූත් වචනයක් වර්තමානයේ පුන පුනා හඳුන්වා දෙන්න උත්සාහ කළද පසුගිය අවුරුදු 25 තුලම ඔවුන් ක්‍රියාවෙන් එම සංහිඳියාව අපට පෙන්නු බව කිව යුතුමය. උදාහරණයක් ලෙස ධම්මසරණ විහාරස්ථානයේදී කිතු හා ඉස්ලාමික බැතිමතුන් උත්සවයේ වැඩ කටයුතු වලට උරදෙමින් කටයුතු කරනු දක්නට ලැබුනා. කතා කරන භාෂාව හෝ අදහන ආගම අනුව වෙන් නොවී එකාවන්ව කටයුතු කල හැකි බව මොවුන්ගේ සෑම ක්‍රියාකාරී කටයුත්තකදීම, පසුගිය අවුරුදු 25 තුල අපට සැපයු ප්‍රබල ආදර්ශයක් සේ සැලකිය හැකියි. තවද ඔස්ට්‍රේලියානුවන් ලෙස මෙහි උපත ලද ඔවුන්ගේ තරුණ දු දරුවන් අපේ ශ්‍රීක ලාංකික සංස්කෘතික හා උරුමය විදහා පාන ක්‍රියාකාරකම් වලදී ඔවුන් සමග එක්වී කටයුතු කරනු මා කොතෙකුත් දැක ඇත. රජත ජයන්තිය සමරන ඔවුන්ගේ**



**ආදී ශිෂ්‍ය සංගමය තව බොහෝ දුරක් ගෙන යාමට එම තරුණ ජවය කටයුතු කරනු ඇතැයි මාගේ විශ්වාසයයි. අගනා සමාජ මෙහෙවරක යෙදෙන මොවුන්ට අප පුවත්පත වෙනුවෙන් ශක්තිය, ධෛර්යය සහ වාසනාව ප්‍රාර්ථනා කරමු.**